සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# දෙවන වාර පරීක්ෂණය 2018

**9 ශ්‍රේණිය** **පුරවැසි අධ්‍යාපනය** **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකයඃ

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.
- 1- 5 දක්වා ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

---

01. සමාජයක මූලික තැනුම් ඒකකය ........................................ ලෙස හඳුන්වයි.

(පාසල, පවුල, ආගමික ආයතන)

02. රටක් තම දේශ සීමාව තුළ බලපැවැත්වෙන පරිදි පනවනු ලබන හා ක්‍රියාත්මක කරනු ලබන නීතිය ........................................ වේ.

(සිවිල් නීතිය, පොදු නීතිය, දේශීය නීතිය)

03. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක ........................................ අධිකරණයේ කාර්යයකි.

(අයිතිවාසිකම් ආරක්ෂා කර දීම, යුතුකම් ඉෂ්ඨ කරවීම, නීති ක්‍රියාත්මක කිරීම)

04. සමාජ සුරක්ෂිතතාව ඇතිකිරීමේ ප්‍රධාන වගකීම පැවරෙන්නේ ........................................

(පුද්ගලයාට ය. ආණ්ඩුවටය, සමාජයට ය.)

05. ජනතාවගේ සුළු ආරවුල් අධිකරණය වෙත නොගොස් නිරාකරණය කර ගැනීමට පිහිටුවා ඇති විකල්ප ආයතනයක් ලෙස ........................................ දැක්විය හැකි ය.

(කාති උසාවි, පවුල් උසාවි, සමථ මණ්ඩල)

- අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද, ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. විද්‍යාත්මක ක්‍රමවේද අනුගමනය කරමින් ගැටලුවක් පිළිබඳ විසඳුම් සොයා ගැනීමට කෙරෙන අධ්‍යයනය පර්යේෂණයයි. (   )

07. රටේ සම්පත් වලින් සීමිත ප්‍රයෝජන ලබාගෙන නාස්තිය අවම කරමින් සංවර්ධන ක්‍රියාවලිය සිදුකළ යුතු වේ. (   )

08. ශ්‍රී ලංකාව අතීතයේ සිටම කෘෂිකර්මය තම ජීවනෝපාය බවට පත්කරගත් රටකි. (   )

09. නව තාක්ෂණික සොයාගැනීම් බහුලව යොදාගෙන ඇත්තේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දියුණුවට ය. (   )

10. සමාජයේ පවත්නා සියලුම රැකියා අවස්ථා වැඩ ලෝකය ලෙස හැඳින්වේ. (   )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන පරිදි පිළිතුරු සපයන්න.**

11. A රූපයේ දැක්වෙන්නේ මැතිවරණයකදී ඡන්ද දායකයෙක් ............................................................ ලබාදෙන අවස්ථාවකි.
12. එය වර්තමානයේ දී ............................................................ ප්‍රජාතන්ත්‍රවාදය ලෙස හඳුන්වනු ලබයි.
13. එය සාර්ථක කර ගැනීම සඳහා ජනතාව පාලකයන් තෝරා ගැනීමේදී ................................................................ කටයුතු කළ යුතු වේ.



A රූපය

14. ඉහත ආකාරයට දේශපාලන බලය ලබා ගැනීමේ අරමුණින් එකට එක් වූ පුද්ගල කණ්ඩායම ............................................................................ ලෙස හඳුන්වයි.
15. ඒක පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වන රටකට උදාහරණයක් ලෙස ................................................. දැක්විය හැකි ය.

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**

16. පළාත් පාලන ආයතන ක්‍රියාත්මක වන්නේ,
    (1) පළාත් සභාවල මගපෙන්වීම යටතේ ය. (2) මධ්‍යම රජයේ මගපෙන්වීම යටතේ ය.
    (3) පාර්ලිමේන්තුවේ මග පෙන්වීම යටතේ ය. (4) ජනාධිපතිගේ මගපෙන්වීම යටතේ ය.
17. පළාත් පාලන ආයතන මූල්‍ය සම්පත් උපයාගන්නා එක් ක්‍රමයක් වන්නේ,
    (1) පොදු සේවා සැපයීමෙන් ලැබෙන ආදායමෙනි.
    (2) සෘජුව ලබාගන්නා රජයේ ඒකාබද්ධ අරමුදලිනි.
    (3) ජනාධිපති අරමුදලෙනි.
    (4) විදේශ රටවලින් ලබාගන්නා ණය වශයෙනි.
18. පළාත් පාලන ආයතනවල සේවා සම්බන්ධයෙන් මහජනතාව විසින් ඉටුකළ යුතු යුතුකමක් වන්නේ,
    (1) පළාත් පාලන ආයතන වලින් සපයන සේවා අවම මට්ටමකින් ප්‍රයෝජනයට ගැනීම ය.
    (2) පළාත් පාලන ආයතන වලින් සපයන සේවා උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම ය.
    (3) පළාත් පාලන ආයතනවලින් සපයන සේවා ප්‍රයෝජනයට නොගැනීම ය.
    (4) ඉහත සඳහන් එකක්වත් නොවේ.
19. පළාත් පාලන ආයතනයක ප්‍රධානියා සතු බලතල අඩංගු පිළිතුර තෝරන්න.
    (1) අදාල සභාවේ මන්ත්‍රීවරයෙකු තෝරා ගැනීම.
    (2) අදාල සභාවේ සියළු අය වැය ලේඛන සකස් කිරීම.
    (3) මහජන උපයෝගිතා සේවා සැපයීමට මුල්වීම.
    (4) පළාත් පාලන ආයතනය හා මධ්‍යම ආණ්ඩුව අතර සම්බන්ධීකරණය සිදු කිරීම.
20. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක සාර්ථකත්වය කෙරෙහි බලපාන ප්‍රධාන සාධකයක් වන්නේ මින් කුමක් ද?
    (1) අවංක, කාර්යශූර, උදාර දේශපාලන නායකත්වය.
    (2) තමන්ගැන සිතමින් අනුන්ට සේවය කරන දේශපාලන නායකත්වය.
    (3) තමාගෙන් පසු තම බලය තම බිරිඳට හෝ දරුවන්ට පවරා දෙන දේශපාලන නායකත්වය.
    (4) මියයන තුරුම බලයේ සිටීමට කැමති දේශපාලන නායකත්වය.

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර එම ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ද සහිතව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. (1) පාසලේ ක්‍රියාත්මකවන සමාජ සංවිධාන 2ක් ලියන්න.
(2) නීතියේ මූලාශ්‍ර 2ක් ලියන්න.
(3) ආර්ථිකයක සිදුවන ප්‍රධාන ක්‍රියාවලි තුනෙන් දෙකක් ලියන්න.
(4) වත්මන් රැකියා වෙළඳපල සමන්විත ප්‍රධාන අංශ දෙක ලියන්න.
(5) ඍජු ප්‍රජාතන්ත්‍රවාදය අතීතයේ ක්‍රියාත්මක කිරීමට පහසු වූ කරුණු දෙකක් ලියන්න.
(6) මැතිවරණයකදී නියෝජිතයන් තෝරා ගැනීමට වර්තමානයේ භාවිතා කරන ශිල්පක්‍රම දෙකක් ලියන්න.
(7) පළාත් පාලන ආයතන සීමා නිර්ණය කිරීමේදී ප්‍රයෝජනයට ගන්නා ප්‍රධාන නිර්ණායක දෙකක් ලියන්න.
(8) ගැටුම් නිරාකරණය සඳහා යොදා ගන්නා ක්‍රමවේද දෙකක් ලියන්න. (ලකුණු 2 x 8 = 16)

02. (i) A රූපයෙන් දැක්වෙන්නේ කවර අවස්ථාවක් ද? (ල. 02)
(ii) සමාජ සුරක්ෂිතතාවය සඳහා පවුලෙන් ඉටුවිය යුතු කාර්යයන් 5ක් ලියන්න. (ල. 05)
(iii) සමාජ විරෝධී ක්‍රියා මැඩපැවැත්වීම හා සමාජ සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා ක්‍රියාත්මක වන ආයතන 4ක් ලියන්න. (ල. 04)



A රූපය

03. (i) පහත ප්‍රකාශ කියවා නිවැරදි ලෙස වගුගත කරන්න.

A වැඩ පහසුවිම
B මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීම.
C කාලය ඉතිරිවීම.
D මිනිසුන් යාන්ත්‍රීකරණය වීම.
E මානව හා සමාජ සම්බන්ධතා පුළුල්වීම.
F සමාජය සංකීර්ණ වීම.
G පරිසර දූෂණය වේගවත් වීම.
H ඵලදායීතාව වැඩි වීම.


| හිතකර බලපෑම් | අහිතකර බලපෑම් |
|---|---|
| | |

(ල. 08)

(ii) A B C රූපවලින් දැක්වෙන්නේ අතීතයේ හා වර්තමානයේ අධ්‍යාපනය සඳහා මිනිසුන් භාවිතා කළ උපකරණ කිහිපයකි. ඒවා නම් කරන්න.



A



B



C

(ලකුණු 03 යි.)

04. (i) A රූපයෙන් ඔබට පෙනෙන සහජීවන ගුණාංග 3 ක් ලියන්න. (ල. 03)

(ii) සහජීවන ගුණාංග ජීවිතයට අදාල කරගැනීම නිසා ලැබෙන වාසි 5 ක් ලියන්න. (ල. 05)

(iii) යහජීවන ගුණාංග පුරුදු පුහුණු නොකිරීමෙන් ලැබෙන අයහපත් ප්‍රතිවිපාක 03 ක් ලියන්න. (ල. 03)



A රූපය

05. (i) පහත දැක්වෙන සටහනේ හිස්තැන් පුරවන්න.

ප්‍රජාතන්ත්‍රවාදය

1. ..............................

2. ..............................

(ල. 02)

(ii) ප්‍රජාතන්ත්‍රවාදයේ සාර්ථකත්වය තීරණය වීම කෙරෙහි බලපාන සාධක 4ක් ලියන්න. (ල. 04)

(iii) පුරවැසියෙකු සතු අයිතිවාසිකම් 5ක් ලියන්න. (ල. 05)

06. (i) ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන මැතිවරණ 4ක් ලියන්න (ල. 04)

(ii) ඡන්ද බලය ලබා ගැනීම සඳහා සපුරාගත යුතු සුදුසුකම් 4ක් ලියන්න. (ල. 04)

(iii) ඡන්ද බලයේ වැදගත්කම විදහාපාන කරුණු 3ක් ලියන්න. (ල. 03)

07. (i) පහත දක්වෙන සටහනේ හිස්තැන් පුරවන්න.

නගරාධිපති (මහජන නියෝජිත)

1. ..............................

2. ..............................

3. ..............................

4. ..............................

5. ..............................

(ල. 05)

(ii) වර්තමාන ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන තුන නම් කරන්න. (ල. 03)

(iii) පළාත් පාලන ආයතන වලින් ඉටුකරන සේවා අඩංගු පහත පින්තූරවල දක්නට ලැබෙන සේවාවන් කුමක්දැයි සඳහන් කරන්න.







1 .............................. 2 .............................. 3 ..............................

(ල. 03)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. පවුල 02. දේශීය නීතිය 03. අයිතිවාසිකම් ආරක්ෂා කර දීම. 04. පුද්ගලයාටය.
05. සමථ මණ්ඩලය 06. ✓ 07. × 08. ✓ 09. × 10. ✓ 11. ඡන්දය
12. වක්‍ර (නියෝජන) 13. බුද්ධිමත්ව 14. දේශපාලන පක්ෂ 15. කියුබාව, උතුරු කොරියාව
16. 2 17. 1 18. 2 19. 3 20. 1

(2 x 20 = 40)

## II කොටස

01. (1) ක්‍රීඩා සමිති, ශිෂ්‍ය සමිති
(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, අණපනත්, සිරිත් විරිත්, අධිකරණ තීරණ, නීති විශාරදයන්ගේ මත, ආගම
(3) නිෂ්පාදනය බෙදා හැරීම, පරිභෝජනය
(4) (i) දේශීය රැකියා වෙළඳපල (ii) විදේශීය රැකියා වෙළඳපල
(5) (i) මිනිස් අවශ්‍යතා සීමිත වීම. (ii) ජනගහනය සීමා සහිත වීම.
(iii) එක් තැනක සිට තීරණවලට එළඹීමේ පහසුව.
(6) (i) සරල බහුතර නියෝජිත ක්‍රමය (ii) සමානුපාතික නියෝජිත ක්‍රමය
(7) (i) ● ජනවාර්ගික ජනගහන අනුපාතය ● භූගෝලීය ප්‍රාදේශීය හා එහි භෞතික ලක්ෂණ
● ජනගහනය හා ජන ඝනත්වය ● ආර්ථික සංවර්ධන මට්ටම
(8) සාකච්ඡා කිරීම, සමතකරණය, මැදිහත්කරණය

02. (i) ප්‍රීතිමත් පවුලක් (ල. 02)
(ii) ● ආදර්ශයෙන් මඟ පෙන්වීම ● ආරක්ෂාව හා රැකවරණ ලබා දීම
● දයාව කරුණාව වැනි ගුණාංග ප්‍රගුණ කිරීම ● චිත්තවේග පාලනයට හුරු කිරීම.
● අන්‍යයන්ට සවන්දීම හා අදහස් වලට ගරු කිරීම. ● එකිනෙකා සමග සහයෝගයෙන් කටයුතු කිරීම ... ආදී. (ල. 04)
(iii) ● ශ්‍රී ලංකා පොලිසිය ● ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
● අන්තරායකර ඖෂධ පාලන ජාතික මණ්ඩලය ● පරිවාස හා ළමා රක්ෂණ සේවා දෙපාර්තමේන්තුව ... ආදී (ල. 04)

03. (i)

| හිතරක බලපෑම් | |
|---|---|
| A , E<br>C , H | B, F<br>D , G |

(ල. 08)

(ii) (i) වැලිපිල්ල (ii) ගල්ලෑල්ල (iii) උඩිස් ප්‍රක්ෂේපණ යන්ත්‍රය (ල. 03)

04. (i) ● සහයෝගයෙන් කටයුතු කිරීම ● බෙදා හදා ගැනීම ● සුහද බව ● අන්‍යයන්ට ගරු කිරීම
● යුතුකම් ඉටු කිරීම ● අන්‍යෝන්‍ය විශ්වාසය ● අවංක බව
(ii) ● පුද්ගල සංවර්ධනය සිදුවීම ● සාමය ස්ථාපිත වීම ● ගැටුම් අවම වීම
● සමාජ සුරක්ෂිතතාවය තහවුරු වීම ● සමාජ සංවර්ධනය වේගවත් වීම
● අන්‍යෝන්‍ය සුහදතාව ගොඩනැගීම
(iii) සමාජ සාමය බිඳ වැටීම, අපචාර වැඩිවීම, සමාජ සුරක්ෂිත බව බිඳ වැටීම, සමාජ විරෝධී ක්‍රියාවලි වැඩිවීම.

05 (i) 1. සෘජු ප්‍රජාතන්ත්‍රවාදය 2. වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය
(ii) ජනමාධ්‍ය නිදහස තිබීම / නීතියේ ආධිපත්‍යය පැවතීම / ප්‍රබල විරුද්ධ පක්ෂයක් තිබීම / ජනතාවගේ දේශපාලන දැනුම අවබෝධය ඉහළ මට්ටමක තිබීම ආදී...
(iii) ජීවත්වීමේ අයිතිය / අධ්‍යාපනය ලැබීමේ අයිතිය / කැමති ආගමක් ඇදහීමේ අයිතිය / නීත්‍යානුකූල රැකියාවක නිරතවීමේ අයිතිය / පාලකයන් තෝරාගැනීමේ අයිතිය .... ආදී ලෙස

06 (i) ජනාධිපතිවරණය / මහ මැතිවරණය / පළාත් සභා මැතිවරණය / පළාත් පාලන මැතිවරණය
(ii) ශ්‍රී ලංකා පුරවැසියකු වීම / වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබීම / ඡන්ද හිමි නාමලේඛනයේ නම ඇතුලත් කර තිබීම / ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඇති අයිතිය අහිමි කර නොතිබීම
(iii) පුරවැසියන්ට ක්‍රියාකාරීව දේශපාලනයට සහභාගි වීමට අවස්ථාව හිමිවීම / සුදුසු පාලකයන් තෝරාගැනීමට අවස්ථාව හිමිවීම / ජනතාවගේ දේශපාලන අවබෝධය පුළුල් කර ගැනීමට අවස්ථාව හිමිවීම .... ආදී

07 (i) 1. නියෝජ්‍ය නගරාධිපති 2. මහජන නියෝජිතවරු 3. රාජ්‍ය නිලධාරීන්
4. නාගරික කොමසාරිස් 5. අනෙකුත් නිලධාරීන්
(ii) මහ නගර සභා / නගර සභා / ප්‍රාදේශීය සභා
(iii) කියවීම් ශාලාව / ඩෙංගු පාලන වැඩසටහන් / මාතෘ සායන